





# ඔන්චිල්ලේ ඉගිල්ලෙන්න



-සයිකල් රේස්, මැරතන්... හරියට මෙයාලට අවුරුදු වගේ: තොර තෝන්චියක් නැතිව මුරගාන 'කොමන්වෙල්ත්"තරඟ සද්දේ රූප පෙට්ටියෙන් ඇහිලා පන්හිඳට කියවුනේ ගමේ අවුරුදු උත්සව සිහිවෙලා වෙන්න ඇති.

-කන් කරච්චලෙන් එහේ වාගෙම තමා" පින්සලට කියවුණා. 'පීනනවා දැක්කම ගඟ හරහා පිනීමේ තරඟ මතක් වෙනවා." පන් ඒ කාලයේ කැළණි ගඟ හරහා පීනන්න හරි සූරයා. පින් නම් දන්නේ ගං වතුරක් ආව දාට යන්තම් ජබ් ගහගන්න විතරයි. ඒකත් පන බේරගන්න ඕන හින්දා.

-ඊස්ටර් හොලිඩේස් අල්ලලා අපේ යාලුවෙක් ගම් රටට යනවලු" පින් කිව්වේ හරියට තමන්ට අවුරුදු කාලයේ ගමට යන්න ලැබුණා වගේ.

-ඊස්ටර් කියන්නනේ අවුරුදු දාම තමා. අපේ කෙනෙක් ලංකාවට යනවා කියන එකත් අපි ගියා වගේම තමයි දැනෙන්නෙ. ලංකාවට යන්න බැරි වුණත් අවුරුදු දාට ගම් රටවල්වලට කෝල් එකක්වත් දෙන්න බැරියෑ. නිවාඩුවක් තියෙන එකේ." පන් කිව්වේ -සන්නස" ට මො-නවා හරි ලියන්න පෑනක් පොතක් ළං කර ගන්න ගමන්.

සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීමත් සමඟම සිංහල අලුත් අවුරුදු උදාව මව්බිමේදී සමරන්නේ සිංහලයින්ම පමණක් නොවේ. දමිළ ජාතිකයින්ද තමන්ගේ චාරිත්‍රානුකූලව වත් පිළිවෙත් පිරීම දක්නට ලැබේ. සිංහල හා හින්දු අළුත් අවුරුද්ද නමින් නම් කළ ද මෙය සිංහල හා දමිළ අලුත් අවුරුද්ද විය යුතු නොවේදැයි තර්කයකි.

කොවුල් කූජනයෙන්ද එරබදු මලින්ද සැරසෙන පරිසරය අවුරුදු කාලය ලොවට කල් ඇතිවම සිහිපත් කරවන්නාසේය. සිය කෙත්වතුවල බව භෝගයන් ළං කර ගැනීමට උත්සුක වන ගැමියන් මෙන්ම තම අස්වනු කපා අටු කොටු පුරවා ගන්නා ගොවියන් තම දූ දරුවන් හා එක්ව සතුටු වන්නට සූදානම් වන කාලයයි පරණ අවුරුද්ද. අතුරු පලයන් ගමේ පොළේදී හෝ වෙනයම් ගැනුම්කරුවන්ට විකුණා ඊට සරිලන්නට ගෙදර අඩු වැඩිය, අළුත් ඇඳුම් ආයිත්තම්, වළං මුට්ටි වැනි මුළුතැන්ගේ උපකරණ මිලදී ගනිමින් ඔවුන් සූදානම් වන්නේ අළුත් අවුරුදු මංගල්‍යයටයි. අන්‍යයන් සඳහා තෑගි බෝග ගැනීමට ද උනන්දු වන්නේ රෙදි පිළිවලට මුල් තැන දෙමිනි.

ගොවිතැන් කටයුතු වලින් මෙන්ම රාජකාරීවලින්ද විරාමයක් ලබනා සිංහලයා මෙම කාලයේ වඩාත් උනන්දු වන්නේ ක්‍රීඩාවල යෙදීමටත්, නෑ ගම් යාමටත්, රසමසවුල් බුක්ති විඳීමටත් යැයි කිවහොත් නිවැරදියි. කොණ්ඩ කැවුම්, මුං කැවුම්, අතිරස, කොකිස්, ආස්මී, අළුවා, අග්ගලා, වැනි සිංහල කැවිලි වරදින නිවෙසක් නම් නොමැති තරම්ය.

-ඒවා නං දැන් මෙහෙත් තියෙනවා. ඩොලර් තමයි ඕනෙ" පින් තොලකට පිහදාන ගමන් කිව්වා.

-ඔන්න පැන්න... ඔන්න පැන්නා... තමුන්ගේ වැඩක් බලා ගන්නවා මේකට හොස්ස දාන්නෙ නැතිව" පන්ට මල පැනලා.

-යහපති දේවයන් වහන්ස ෟ" පන් කිව්වේ ඔලොක්කුවට.

සූර්යයාගේ රාශීන් මාරුවීමේ මේ සංක්‍රාන්ති කාලය -නොනගත කාලය" නමිනුයි ගැමි වහරෙහි යෙදෙනුයේ. පරණ අවුරුද්දේ කරමින් සිටි සියලු වැඩ නවත්වා පුණ්‍ය කටයුතුවල හා ක්‍රීඩාවන් හි යෙදීම සඳහායි නොනගතය වෙන් වනුයේ. ඉවුම් පිහුම්, කෑම බීම, ගනුදෙනු පොත පතේ වැඩ සියල්ලත් මේ අනුව නැවතේ. පුණ්‍ය කාලය නමින්ද හැඳින්වෙන මේ කාලයේ දී ගමේ පන්සල් පිරී ඉතිරී යයි. චක් ගුඩු පැනීම, ඔළිඳ කෙළිය, පංචා දැමීම වැනි සිංහල ගැමි ක්‍රීඩා දිනෙන් දින අභාවයට යමින් පැවතුනද, දාදු කෙළිය, ඔන්චිල්ලාව, රබන් වැයීම වැනි දේ තවමත් ගම්වල දක්නට ලැබේ. සංවිධානාත්මක අවුරුදු ක්‍රීඩා උත්සවවලට එක්වන, කඹ ඇදීම, කොට්ට පොර ගැසීම, පොර පොල් ගැසීම, කණා මුට්ටය බිඳීම, අලියාට ඇස් තැබීම, තරගයට පොල් අතු විවීම, පොල් ගෑම, කතුරු ඔන්චිල්ලාව වැනි අංග එම උත්සව වඩාත් උණුසුම් කරවයි. රතිඤ්ඤා හඬ අවුරුදු කාලයේ අසන්නට ලැබෙන විශේෂ හඬක්. අවුරුදු සමයේ කලට වේලාවට සිරිත් පිළි පැදීමට උනන්දු වන සිංහලයාට එකී නැකත් වේලාවන් දැනවීමටද රතිඤ්ඤා පත්තු කිරීම පුරුද්දක් වී ඇත්තා සේය.

සුභ මොහොතින් නව වර්ෂය ලබත්ම නිවසේ ගෘහණිය විසින් මොළවනු ලබන ලිපෙන් කිරි මුට්ටිය ඉතිරවීම නිවෙසට සෞභාග්‍යය ගෙන දෙන පෙර නිමිත්තක් හැටියට සලකනු ලැබේ. අනතුරුව පළතුරු, රස කැවිලි, ගිතෙල්, හකුරු සහ ව්‍යංජන මුහු කරගත් කිරිබතින් නැකතට ආහාර අනුභවයෙහි යෙදීමයි සිරිත. සියලුදෙනා වැඩිහිටියනට බුලත් හුරුළු දී නමැද, තම තමන්ගේ කාර්යයන් හි නියැලීම වැදගත්ම කටයුත්ත සේ සැලකේ. වත්තෙහි පැලයක් ඉන්දවීම, දරු දැරියන් පොත පතෙහි වැඩවල යෙදීම වැනි දෙයින් වැඩ ඇල්ලීම සංකේතවත් කෙරෙන අතර ගෘහණිය පඬුරක් ළිඳට දමා පැන් කලයක් ගෙදරට ගෙන ඒමෙන් ගනුදෙනු කිරීම අරඹනු ලැබේ.

ගොවිතැන් කටයුතු වලින් මෙන්ම රාජකාරීවලින්ද විරාමයක් ලබනා සිංහලයා මෙම කාලයේ වඩාත් උනන්දු වන්නේ ක්‍රීඩාවල යෙදීමටත්, නෑ ගම් යාමටත්, රසමසවුල් බුක්ති විඳීමටත් යැයි කිවහොත් නිවැරදියි. කොණ්ඩ කැවුම්, මුං කැවුම්, අතිරස, කොකිස්, ආස්මී, අළුවා, අග්ගලා, වැනි සිංහල කැවිලි වරදින නිවෙසක් නම් නොමැති තරම්ය.
-ඒවා නං දැන් මෙහෙත් තියෙනවා. ඩොලර් තමයි ඕනෙ" පින් තොලකට පිහදාන ගමන් කිව්වා.

නෑසියන් දැක්මට යාම අලුත් අවුරුද්දේ මූලිකාංගයක්. පරණ සිත් අමනාපකම් මඟ හරවා ගැනීමට බුලත් හුරුළු දීම ඉතාමක් හරවත් සිරිතක් නොවේද? නැකතට හිස තෙල් ගෑම, අළුත් සඳ බැලීම, රාජකාරී සඳහා නිවෙසින් පිටවීම ආදී මෙකී නොකී සියලු සිරිත් පසුබිමින් ඇත්තේ සිංහලයාගේ අගනා පාරම්පරික හර පද්ධතීන් නොවේද?

-අවුරුද්ද ගැන නම් ඉතින් පිටුවක් නෙවෙයි, පත්තරේම පිරෙන්න වුණත් ලියන්න බැරියැ" පන් හති ඇරියා. ඒ අල්ල පනල්ලේ පින් තමන්ගේ වැඩේ අහවර කරලා. ඔන්චිලි පදින ළමිස්සියක් ෟ ඒ චිත්‍රය දැක්කම පන්ට ඉබේටම වාගේ තමන් අතින් ලියවුණා පදවැලක් කටට ආවා.

'ඔන්චිල්ලේ ඉගිල්ලෙන්නේ..."

-අවුරුදු සින්දුවක් නේද? ඕකත් ඔය ලියවිල්ලටම ලියලා දැම්මනං?" පින් මිමිණුවා.

ශ්‍රී ලංකා රූපවාහිනියේ අවුරුදු වැඩසටහනක් වෙනුවෙන් රචනා කළ මෙම ගීය ගායනා කළේ ළමා ගායිකා මළිඳු සමරවික්‍රම. සංගීත විෂය කථිකාචාර්යවරයකු වන තරංග සමරවික්‍රමගේ සංගීත රටා එකතුවක් විදියට එළි දැක්වුණා. -සඳ තරු මල්" සංගීත තැටියට එක් වුණ මෙය හොරණ ප්‍රදේශයේ ගැමි වෙල් එළියක අපූරුවට රූගත කරලා තිබුණා. කොළඹ ගොඩගේ පොත් සමාගම, මඟින් දියත් කළ කාව්‍ය සහ ගීත ව්‍යාපෘතිය මඟින් ප්‍රකාශ කිරීමට තෝරා ගැනුණ -සිසිරගේ කුරුටු ගී" පොතේ තිස්වන පද රචනාවයි මේ.

ඔන්චිල්ලේ ඉගිල්ලෙන්න
පන්චන්ගේ අය බලන්න
ඔන්න ඉතින් තවත් වරක්
අවුරුද්දක් ආවා
අවුරුද්දේ රඟ බලන්න
නිවාඩුවක් ආවා ෟ

ගවුම් පොඩිති නංගිලාට
සරම් පොඩිති මල්ලිලාට
අම්මාගේ චිත්තයේ
එරබදු මල් පිපිලා
අටු පිරවූ අප්පච්චිට
පඹයා හිනැහෙනවා

කැවුම් පොඩිති නැන්දලාට
කොකිස් පොඩිති මාමලාට
සීයාගේ බුලත් වැලේ
කොහා කොහෝ ගෑවා
සිල් මිදවූ අත්තම්මට
නෑයෝ පිරිවැරුවා



කේමදාස මාස්ටර්
සිතුවම ආර් ඒ සී ඉදුවර ගුණසේකර